දුරකථන ) 0112669192 ,0112675011
தொலைபேசி 0112698507 , 0112694033
Telephone ) 0112675449 ,0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம்

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல )
My No. )CF/EXJ/01/2022

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி )2022.01.25
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

**පොදු චක්‍රලේඛ ලිපි අංක :- 02- 06 /2022**

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා ජාතික රෝහල,
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
රේඛීය අමාත්‍යාංශ යටතට ගැනෙන සියලුම රෝහල් අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
අදාල ආයතන ප්‍රධානීන් වෙත.

**මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පි II "අ" ඛණ්ඩයේ / II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ දෙපාර්තමේන්තු පරීක්ෂණය - 2021 (දෙවන වාරය)**

මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පි II "අ" ඛණ්ඩයේ / II ශ්‍රේණියේ නිලධාරීන්, II ශ්‍රේණියට නියමිත වැටුප් පරිමාණයේ හතරවැනි වැටුප් පියවරට එළඹීමට පෙර සමත්විය යුතු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලබන බව නිවේදනය කරනු ලැබේ. **(විෂයානුබද්ධ ලිඛිත ප්‍රශ්න පත්‍රය ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ)**. විභාගය පවත්වනු ලබන දිනය ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

**02. සුදුසුකම්**

මෙම විභාගයට අයදුම්කළ හැක්කේ මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පි II "අ " ඛණ්ඩයට / II ශ්‍රේණියට පත්වීම් ලද හා මෙතෙක් එම විභාගය සම්පූර්ණකර නොමැති නිලධාරීන්ට පමණි.

**සැ.යු :- 2021/06/30 දින වන විට II ශ්‍රේණියට පත්කර අදාල පත්වීම් ලිපිය ලබා ඇති නිලධාරීන්ගේ අයදුම්පත් පමණක් මා වෙත එවීමට කටයුතු කරන්න.**

**03. අයදුම්පත්**

මෙම චක්‍රලේඛ ලිපිය අවසානයේ දක්වා ඇති ආකෘතියට අනුව අයදුම්කරුවන් විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින්, කොළඹ 10 පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, අංක 385, "සුවසිරිපාය" සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (විභාග) වෙත **2022/02/18** දින හෝ ඊට පෙර ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. තම අයදුම්පත සමඟ රාජකාරී ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු. 45.00 ක් වටිනා මුද්දර ඇල වූ "9×4" ප්‍රමාණයේ ලියුම් කවර තුනක් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත්ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සැ යු : - **ආදර්ශ අයදුම්පත්‍රයෙහි ආකෘතියට අනුව අයදුම්පත්‍රය A4 කඩදාසියක පළමු පිටුවේ අංක 01-04 දක්වාත්, දෙවැනි පිටුවේ අංක 05 - 09 දක්වාත් වන සේ සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියලුම අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**04. විභාග ගාස්තු**

I. විභාගයට පළමුවරට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25.00 බැගින් අවලංගු නොකළ මුද්දර ඉල්ලුම්පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා එවා නිසි ලෙස අවලංගු කළයුතුය.

II. කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබේ.

**05. විභාගයට ඇතුලත් කර ගැනීම**

I. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණකර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

II. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාව තහවුරු කළයුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළයුතුය.

(අ) ජාතික හැඳුනුම් පත්‍රය
(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදාළ ආයතනයක් මගින් විධිමත් ලෙස නිකුත් කරනු ලැබූ හැඳුනුම්පත්‍රය
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය
(ඇ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

**06. විභාග පරිපාටිය**

මෙම විභාගය දෙපාර්තමේන්තු පරීක්ෂණය සහ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය යනුවෙන් කොටස් දෙකකි. දෙපාර්තමේන්තු පරීක්ෂණය, විෂයානුබද්ධ ලිඛිත, වාචික සහ ප්‍රායෝගික වශයෙන් කොටස් තුනකින් යුක්ත වන අතර, එක් එක් කොටස සඳහා ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා සෑම කොටසකටම අවම වශයෙන් ලකුණු **40** ක් ලබාගත යුතුය.

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය **ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති යනුවෙන් හා මුදල් රෙගුලාසි** යනුවෙන් විෂයන් දෙකකින් සමන්විත වන අතර විෂයන් දෙකටම ලකුණු 100 බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා සෑම විෂයකටම අවම වශයෙන් ලකුණු **40** ක් ලබාගත යුතුය.

එක්වරකදී හෝ කිහිපවරකදී, විෂයයන් / කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණකළ හැකිය. ප්‍රථමවරට විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් සියලුම විෂයයන් අයදුම් කළයුතුය.

**07. විෂය නිර්දේශ මාලාව**

**07.1 දෙපාර්තමේන්තු පරීක්ෂණය**

**07.1.1 විෂයානුබද්ධ ලිඛිත ප්‍රශ්න පත්‍රය**

(අ) විෂය ක්ෂේත්‍රයට අදාළ පැය තුනක (03) ක ප්‍රශ්න පත්‍රය රචනා ප්‍රශ්න (08) අටකින් සමන්විත වනු අතර ඉන් ප්‍රශ්න (05) කට පිළිතුරු සැපයිය යුතුයි. **ලකුණු 100කි.**

i. මැලේරියා, බරවා, ශ්වසන රෝග, ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස්, ලාදුරු යන විෂය ක්ෂේත්‍ර
ii. රසායනාගාර කළමනාකාරීත්වය

07.1.2 **ප්‍රායෝගික පරීක්ෂණය :-** විෂය ක්ෂේත්‍රයට අදාළව හැකියාවන්, ක්‍රියාකාරකම් හා බැඳුණු ප්‍රායෝගික පරීක්ෂණයකි. විෂයානුබද්ධ ලිඛිත පරීක්ෂණයට අදාළවන විෂය නිර්දේශය මෙයටද අදාල වේ. **ලකුණු 100කි.** කාලය පරීක්ෂණය අනුව තීරණය වේ.

07.1.3 වාචික පරීක්ෂණය :- විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රයට අදාළ විෂය නිර්දේශයට අදාළව හා සේවයේ යෙදීමේදී එළඹිය හැකි ගැටලු පිළිබඳ වාචික පරීක්ෂණයකි. ලකුණු 100කි. කාලය විනාඩි 15කි.

**07.2 කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

**07.2.1. ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති ප්‍රශ්න පත්‍රය**

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය (02) දෙකකි. රචනා මාදිලියේ ප්‍රශ්න (07) හතකින් සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සැපයිය යුතුයි. මුළු ලකුණු 100කි.

**ආයතන සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති මත සැකසේ. ආයතන සංග්‍රහයේ සඳහන් පහත පරිච්ඡේද**

| | | |
|---|---|---|
| XV | වන පරිච්ඡේදය - | අධ්‍යනය, අභ්‍යාස හෝ රාජකාරි කටයුතු සඳහා පිටරට යාම |
| XVI | වන පරිච්ඡේදය - | නිවාඩු ගමන් |
| XXIII | වන පරිච්ඡේදය - | ඇතැම් වර්ග වල රෝගවලින් පෙලෙන රජයේ නිලධාරීන්ට විශේෂ අනුග්‍රහය හා ඒ පිළිබඳ කොන්දේසි |
| XXIV | වන පරිච්ඡේදය - | වැටුප් ණය අත්තිකාරම් |
| XXV | වන පරිච්ඡේදය - | වෘත්තිය සංගම්වල සාමාජිකයින්ට අනුග්‍රහය |
| XXVII | වන පරිච්ඡේදය - | ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග |
| XXVIII | වන පරිච්ඡේදය - | පරිපාලන කාර්ය පරිපාටි සහ විධි |
| XXX | වන පරිච්ඡේදය - | රාජ්‍ය නිලධාරීන් සම්බන්ධව ආණ්ඩුව සතු බලතල |
| XXXIII | වන පරිච්ඡේදය - | නීති උපදෙස් සහ නීති ක්‍රියාමාර්ග |
| XLVII | වන පරිච්ඡේදය - | සාමාන්‍ය හැසිරීම සහ විනය |
| XLVIII | වන පරිච්ඡේදය - | විනය කාර්ය පරිපාටිය |

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති**

**07.2.2. මුදල් රෙගුලාසි ප්‍රශ්න පත්‍රය**

මෙම ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය (02) දෙකකි. රචනා මාදිලියේ ප්‍රශ්න (07) හතකින් සමන්විතය. එයින් ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සැපයිය යුතුයි. මුළු ලකුණු 100කි.

**මුදල් රෙගුලාසි සංග්‍රහයේ පහත පරිච්ඡේද මත සැකසේ.**

| | | |
|---|---|---|
| VI | වන පරිච්ඡේදය - | ආණ්ඩුවේ මුදල් යනාදියෙහි භාරකාරත්වය, අග්‍රිමය හා බැංකු ගිණුම්, රාජ්‍ය මූල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩල, අයිරාව බැංකු ගිණුම්. (මු.රෙ. 315 සිට මු.රෙ. 396 දක්වා) |
| XIII | වන පරිච්ඡේදය - | සැපයීම් වැඩ හා සේවා සැපයීම් මිලට ගැනීමේ ක්‍රියාවලිය, ගබඩා සමීක්ෂණ, ගබඩාකරණ ක්‍රියාවලිය, කොන්ත්‍රාත්, ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරවීම. (මු.රෙ. 708 සිට මු.රෙ. 775 දක්වා) |

**08. විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම**

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ පිළිතුරු පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොලයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ බලා පිළිතුරු ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ පිළිතුරු පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන්ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

**09.** කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ සේවයේ නියුතු අදාළ නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේද ඇතුලත් කර ඇත.

**සැ.යු මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවක් මතු වුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත් වේ.**

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන)
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

චාමික එච් ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
ලේකම් වෙනුවට
සෞඛ්‍ය අමාත්‍යාංශය

EXJ

ආදර්ශ අයදුම්පත

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

**මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පි II පන්තිය "අ" බණ්ඩයේ / II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා දෙපාර්තමේන්තු පරීක්ෂණය - 2021 (දෙවන වාරය)**

01. (අ) I. අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) - ....................................................

II. අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |

III. මුලකුරු සමඟ නම (සිංහලෙන්)- ....................................................

IV. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |

(ආ) I. II "අ" බණ්ඩයට / II ශ්‍රේණියට උසස්කළ දිනය - ....................................................

II "අ" බණ්ඩයට / II ශ්‍රේණියට උසස්කළ ලිපි අංකය - ....................................................

II දැනට ලබන වාර්ෂික වැටුප - ....................................................

III. ජාතික හැඳුනුම්පත් අංකය - | | | | | | | | | | | | |

IV ජංගම දුරකථන අංකය - | | | | | | | | | | |

v විද්‍යුත් ලිපිනය - ....................................................

02. ඔබ මෙවර පෙනිසිටීමට බලාපොරොත්තු වන විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුළ (√) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (X) ලකුණ යොදන්න.

| | | | |
|---|---|---|---|
| විෂයානුබද්ධ දැනුම | ☐ | විෂයානුබද්ධ ප්‍රායෝගික පරීක්ෂණය | ☐ |
| ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | ☐ | විෂයානුබද්ධ වාචික පරීක්ෂණය | ☐ |
| මුදල් රෙගුලාසි | ☐ | | |

03. (අ) දැනට සේවය කරන ආයතනය :- සිංහලෙන් ....................................................

ඉංග්‍රීසියෙන් ....................................................

(ආ) මෙම ආයතනය අයත් වන්නේ :- රේඛීය අමාත්‍යංශයට ☐ පළාත් සභාවට ☐

(ඇ) පළාත් සභාවට නම් අදාළ පළාත :- ....................................................

(ඈ) එය අයත් දිස්ත්‍රික්කය - ....................................................

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා නිවැරදිව හා පැහැදිලිව ලිපිනය ලියන ලද "9×4" ප්‍රමාණයේ රු 45.00 ක මුද්දර ඇලවූ ලියුම් කවර 03ක් අයදුම්පත්‍රයට අමුණන ලද්දේද ? ....................................................

(ඊ) 1. තැපැල් ලිපිනය (සිංහලෙන් හෝ දෙමළෙන්) - ....................................................

2. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - ....................................................

04. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) - ....................................................

05. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද?....................................................

(ආ) අයදුම්පත් ඉදිරිපත් කරන්නේ ප්‍රථම වරට නොවේනම් මුද්දර අලවා තිබේද?....................................................

මුද්දර කොටුව

**06.** **අයදුම්කරුගේ සහතිකය**

(i) මගේ දැනුම හා විශ්වාසය පරිදි මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වරට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/ ප්‍රථම වරට නොවන බැවින් රු.......................ක් වටිනා මුද්දර අලවා ඇති බවත්* මෙම ඉල්ලුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(ii) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

..................................
අයදුම්කරුගේ අත්සන

දිනය ..............................

**07.** **පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිලධාරියාගේ සහතිකය**

මෙම අයදුම්පත භාරගන්නා අවසාන දිනයට පෙර මා වෙත භාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපිගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

දිනය..............................

.....................................
නම සහ අත්සන

**08.** **ආයතන ප්‍රධානියාගේ සහතිකය**

.................................................................................................මහතා/මහත්මිය/මෙනවිය*
........................................................................ නිලධාරියෙකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත් අයදුම්පතේ ඇතුලත් කර ඇති තොරතුරු නිවැරදි බවත්, අයදුම්කරු විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වරට බවත් විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්,මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් සහතික කරමි

දිනය ........................

.......................................
ආයතන ප්‍රධානියාගේ අත්සන
[රබර් මුද්‍රාව තැබිය යුතුය]

**09.** **විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය**

...............................................................................මහතා / මහත්මිය/ මෙනවිය* II පන්තියේ "අ" ඛණ්ඩයේ / II ශ්‍රේණියේ මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී නිලධාරියෙකු වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට / ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය ........................

............................................
විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ
අත්සන [රබර් මුද්‍රාව තැබිය යුතුය]

**( *අනවශ්‍ය කොටස් කපා හරින්න )**